දුරකථන / தொலைபேசி / Telephone ) 0112669192 , 0112675011 ) 0112698507 , 0112694033 ) 0112675449 , 0112675280

ෆැක්ස් / பெக்ஸ் / Fax ) 0112693866 ) 0112693869 ) 0112692913

විද්‍යුත් තැපැල / மின்னஞ்சல் முகவரி / e-mail ) postmaster@health.gov.lk

වෙබ් අඩවිය / இணையத்தளம் / website ) www.health.gov.lk

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය / எனது இல / My No. ) NCCP/ADM/30/2020

ඔබේ අංකය / உமது இல / Your No. )

දිනය / திகதி / Date ) 01/11/2020

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

පොදු චක්‍රලේඛ අංක : 01- 44 / 2020

සියළුම පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,
සියළුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
සියළුම ජාතික රෝහල් / ශික්ෂණ රෝහල් / පළාත් මහ රෝහල් / දිස්ත්‍රික් මහ රෝහල්වල අධ්‍යක්ෂවරුන්,
මූලික රෝහල්වල වෛද්‍ය අධිකාරීවරුන්,
අධ්‍යක්ෂ - පෞද්ගලික සෞඛ්‍ය අංශ සංවර්ධන,
පෞද්ගලික වෛද්‍ය ආයතනවල අධ්‍යක්ෂවරු / වෛද්‍ය අධ්‍යක්ෂවරුන්

## ජාතික පිළිකා ලේඛනයට ඇතුලත් කිරීම සඳහා අලුතින් හඳුනා ගත් පිළිකා රෝග වාර්තා කිරීම අනිවාර්ය කිරීම

පිළිකා ආවේක්ෂණය (පිළිකා ලියාපදිංචි කිරීම) යනු රටක හෝ නිශ්චිත භූගෝලීය ප්‍රදේශයක් තුල හඳුනාගන්නා සියළුම පිළිකා රෝග වලට සම්බන්ධ වසංගත විද්‍යාත්මක තොරතුරු ක්‍රමානුකූලව හා අඛණ්ඩව එකතු කිරීම, ගබඩා කිරීම, විශ්ලේෂණය කිරීම, අර්ථ නිරූපණය කිරීම සහ බෙදා හැරීමයි. මෙම තොරතුරු රටක පිළිකා මර්දන වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා අත්‍යාවශ්‍ය වේ.

සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් ජාතික පිළිකා මර්දන වැඩසටහන වසර 30 කට වඩා අධික කාලයක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ පිළිකා තත්ත්වය පිළිබඳ ආවේක්ෂණ කටයුතුවල නිරත වේ. අළුතින් හඳුනාගත් පිළිකා පිළිබඳ තොරතුරු, රෝග විනිශ්චය කිරීමේ මධ්‍යස්ථාන (පටක ව්‍යාධිවේදී, රුධිර ව්‍යාධි වේදී, මුඛ ව්‍යාධි වේදී විද්‍යාගාර ආදිය) සහ ප්‍රතිකාර මධ්‍යස්ථාන (විශේෂ පිළිකා ප්‍රතිකාර ඒකක, පිළිකා රෝගීන්ට ප්‍රතිකාර කරන වෙනත් ඒකක) වෙතින් ජාතික පිළිකා මර්දන වැඩසටහන එකතු කර ගනු ලැබේ.

වර්තමානයේ පිළිකා රෝග පිළිබඳ දත්ත වාර්තා කිරීම සීමා වීමට බලපාන ප්‍රධාන සාධක 2ක් හඳුනාගෙන ඇත.

i. පෞද්ගලික අංශයට අයත් ව්‍යාධිවේදී රසායනාගාර සහ පිළිකා ප්‍රතිකාර ඒකක මඟින් දත්ත වාර්තා කිරීම අඩුවීම.

ii. විශේෂ පිළිකා ප්‍රතිකාර ඒකක නොවන රජයේ ප්‍රතිකාර මධ්‍යස්ථානවල පවා (උදා :- විවිධ ශල්‍ය වෛද්‍ය ඒකක, මුඛ හනුක සහ වක්ත්‍ර ශල්‍ය වෛද්‍ය ඒකක, ආමාශ ආන්ත්‍රික ඒකක, චර්ම රෝග ඒකක, රුධිර ව්‍යාධිවේදී ඒකක ආදිය) දත්ත වාර්තා කිරීම අඩු වීම.

2006 අංක 26 දරණ පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ 10 (ඇ) හා 19.6 (ආ) වගන්තිවලට අනුව, පුද්ගලික අංශයේ ආයතන වලින් වාර්තා රැස් කිරීම, එම දත්ත හා සංඛ්‍යා ලේඛන ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය වන බලය පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවට සහ සෞඛ්‍ය අමාත්‍යාංශයට පැවරී ඇත.

එබැවින් පිලිකා වාර්තාකරණයේ සීමාවන් මග හරවා ගැනීම සඳහා පහත ක්‍රියා මාර්ග වහාම ක්‍රියාතමක කළ යුතුය.

i. ව්‍යාධිවේද රසායනාගාරවල අලුතින් හඳුනාගත් පිළිකා පිලිබඳ දත්ත රැස් කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශ දෙකේම "Cancer Return Form 1" (H 1290) භාවිතා කල යුතුය.

ii. පහත සඳහන් රෝගීන්ට පිලිකා සඳහා ප්‍රතිකාර කරන විට ප්‍රතිකාර මධ්‍යස්ථාන වල දී "National Cancer Surveillance Form" (H 1256) පිරවිය යුතුය.

a) පිළිකා සායනවල ප්‍රතිකාර ලබාදෙන අළුතින් පිළිකාවක් ඇති බවට හඳුනාගත් සියළුම රෝගීන්

b) පිළිකා ප්‍රතිකාර ඒකක හැර වෙනත් රජයේ හා පෞද්ගලික ප්‍රතිකාර ඒකක වලදී (උදා: - මුඛ, හනුක හා වක්ත්‍ර ශල්‍ය වෛද්‍ය ඒකක, ආමාශ ආන්ත්‍රික ඒකක, චර්ම රෝග ඒකක, රුධිර ව්‍යාධිවේදී ඒකක ආදිය) පිළිකා සඳහා නිශ්චිත ප්‍රතිකාර (උදා:- සැත්කම්, විකිරණ චිකිත්සාව, රසායනික චිකිත්සාව, හෝමෝන චිකිත්සාව, ප්‍රතිශක්ති චිකිත්සාව) ප්‍රතිකාර ලබා දෙන සියළුම පිළිකා රෝගීන්

අදාල ආකෘති පත්‍ර මේ සමඟ අමුණා ඇත (ඇමුණුම I හා II) ආකෘති පත්‍රය පිරවීමට අවශ්‍ය උපදෙස් ඇතුලත් "Standard Operating Procedures for Cancer Registration in Sri Lanka" නම් පොතේ මෘදු පිටපත් **www.nccp.health.gov.lk** වෙබ් අඩවියෙන් ලබාගත හැක.